# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

## පළමු වාර පරීක්ෂණය

10 ශ්‍රේණිය — කාලය පැය 02යි

I කොටස

- සියලු ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙන ඒවායින් දත්තයක් (data) ලෙස හැඳින්වෙන්නේ කුමක්ද?
   1. එක් එක් ශිෂ්‍යයා පන්තියේ ලබා ගත් ස්ථානය
   2. වාර විභාගයේදී ශිෂ්‍යයකු ලබා ගත් ලකුණු
   3. පන්තියක ශිෂ්‍යයන් ලබා ගත් ලකුණුවල මධ්‍යයනය
   4. පන්තියක ශිෂ්‍යයින් ලකුණු ලබා ගත් අනුපිළිවෙළ අනුව සකස් කළ ලැයිස්තුව

2. දත්ත තොරතුරු බවට පත් කිරීමේදී පහත කවරක් සිදුවේද?
   1. සංදර්ශනය කිරීම (displaying)
   2. පරීක්ෂා කිරීම (testing)
   3. ක්‍රමලේඛනය (programming)
   4. සැකසුම ( processing)

3. පහත ඒවා අතරින් තොරතුරු ඇතුළත් නොවන්නේ කවර එකෙහිද?
   1. භාණ්ඩ අසුරනයක ඇති ලේබලයක
   2. පන්ති පිරිසිදු කිරීමේ සටහන
   3. කාලගුණ වාර්තාවක
   4. ලේබල් නොකරන ලද වට ප්‍රස්තාරයක

4. අන්තර්ජාලය ඔස්සේ ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව හා නීති පද්ධතිය පිළිබඳ තොරතුරු ලබා ගත හැක්කේ
   1. ඉ- තක්සලාව
   2. ඉ- රාජ්‍ය
   3. නිල අන්තර්ජාල බිහිදොර
   4. නැණසල

5. පළමු පරම්පරාවේ පරිගණක පද්ධතියක් නොවන්නේ පහත සඳහන් ඒවා අතරින් කවරක්ද?
   1. ENIAC
   2. EDVAC
   3. UNIVAC
   4. IBM 360/ 370

6. පරිගණකවල 3වන පරම්පරාවේදී සිදුවූ සුවිශේෂි සිදුවීම වන්නේ,
   1. පරිගණක චිත්‍රක අතුරු මුහුණත් සහිත මෙහෙයුම් පද්ධතිය ( GUI)
   2. ක්ෂුද්‍ර සකසන ( Microprocessors)
   3. පෞද්ගලික පරිගණක (Personal computers)
   4. යතුරු පුවරුව ( Keyboard )

anned by janelaya.com

7. පරිගණකගත කිරීම (Computerization) සුදුසු නොවන්නේ පහත කවර අවස්ථාවක් සඳහාද ?
    1. පිළිතුරු පත්‍රවල ඇති ලකුණේ මධ්‍යයනය ගණනය කිරීමට
    2. පාසල් විද්‍යාගාරයේ ඇති රසායනික ද්‍රව්‍යයල තොරතුරු ඇතුළත් කිරීමට
    3. විභාගයක රචනා වර්ගයේ පිළිතුරු පත්‍ර ලකුණු කිරීමට
    4. පාසල් ශිෂ්‍ය නායකයින්ගේ දත්ත එකතුවක් පවත්වා ගැනීමට

8. දෙවන පරම්පරාව (2nd Generation ) පරිගණකවලට පාදක වූයේ,
    1. රික්තක නල ( Vacuum tubes)
    2. අනුකලිත පරිපථ ( Integrated circuits )
    3. ක්ෂුද්‍ර සකසන ( Microprocessors )
    4. ට්‍රාන්සිස්ටර ( Transistors)

9. රික්තක නල , ට්‍රාන්සිස්ටර මගින්ද, පසුව ට්‍රාන්සිස්ටර, ක්ෂුද්‍ර සකසු මගින්ද ප්‍රතිස්ථාපනය කිරීමෙන් පරිගණක වල කුමක් වැඩිවිද?
    1. හැකියාව ( capability)
    2. ප්‍රමාණය (size)
    3. විද්‍යුත් පරිභෝජනය( power consumption)
    4. නිපදවන තාපය (heat)

10. පරිගණකයක උපදෙස් සකසනු ලබන, ගණනය කිරීම් සිදු කරන, තර්කානුකූල තීරණ ගනු ලබන හා පරිගණක පද්ධතිය හරහා ගලා යාම කළමනාකරණය කරනු ලබන කොටස වන්නේ ,
    1. මෘදුකාංග (software)
    2. ස්ථිරාංග (firmware)
    3. ජීවාංග (liveware)
    4. දෘඩාංග (hardware)

11. පහත ඒවා අතරින් සුපරීක්ෂක (Scanner) වර්ගයට අයත් වන්නේ,
    1. ආලෝක පෑන (Light pen)
    2. තීරු කේත කියවනය ( Barcode reader )
    3. මෙහෙයුම් යෂ්ටිය ( Joystick )
    4. මාර්ග ගුලාව (Trackball)

12. පහත ප්‍රකාශ අතරින් සත්‍ය වන්නේ කවර ඒවාද?
    A. මෙහෙයුම් යෂ්ටිය (Joy Stick)ආදාන උපාංගයකි (input device)
    B. මොනිටරය ( monitor) ප්‍රතිදාන උපාංගයකි (output device)
    C. සුසංහිත ඩිස්කය (compact disk) ආචයන උපාංගයකි( storage device)

    1. A පමණි
    2. Bපමණි
    3. A හා C පමණි
    4. ඉහත සඳහන් සියල්ලම

13. ඩිජිටල් කැමරාවක් මගින් ඡායාරූපයක් ගත් පුද්ගලයෙකු කැමරාවේ ඇති සන්දර්ශකය (display) මගින් එම ඡායාරූපය අනිත් පුද්ගලයාට පෙන්වයි.මෙහිදී කැමරාවෙහි කාර්යය වන්නේ,
    1. ආදාන (Input ) උපක්‍රමයක් ලෙසිනි
    2. ප්‍රතිදාන (Output) උපක්‍රමයක් ලෙසිනි
    3. සන්නිවේදන(Communication) උපක්‍රමයක් ලෙසිනි
    4. ආදාන / ප්‍රතිදාන ( Input/ output ) උපක්‍රමයක් ලෙසිනි

anned by janelaya.com

14. උකුල් පරිගණකයක්, පහත දක්වා ඇති ඒවායින් කුමන පරිගණකයක ගණයට අයත් වේද?
   1. මධ්‍ය පරිගණක ( mini computers)
   2. මහා පරිගණක ( main frame)
   3. ක්ෂුද්‍ර පරිගණක (micro computers)
   4. සුපිරි පරිගණක ( super computers)

15. පහත ඒවායින් සෙවුම් එන්ජිමක් ( search engine) නොවන්නේ,
   1. Macromedia Flash
   2. Google
   3. Yahoo
   4. MSN

16. ලොක විසිරි වියමන (world wide web) පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
   1. දැවැන්ත විද්‍යුත් ලේඛන සුරක්ෂිතාගාරයකි ( respository)
   2. ලෝක ව්‍යාප්ත පරිගණක ජාලයකි
   3. අන්තර්ජාලයට තවත් නමකි.
   4. අන්තර්ජාලය හරහා ප්‍රවේශ විය හැකි අන්තර්සම්බන්ධිත ( interlinked) අධිපාඨ (hypertext) අඩංගු ලේඛන (document) පද්ධතියකි

17. පරිගණක ජාලයෙහි මුර පදයේ (Password) අරමුණ වන්නේ,
   1. ජනතාවට ඊට පිවිසීමට අවස්ථාව ලබා දීමටයි
   2. ආරක්ෂාව සැලසීමට හා පිවිසීම පාලනය කිරීමටයි
   3. පරිගණකයේ වේගය වැඩි කිරීමටය
   4. භාවිත කරන සියල්ලන්ටම සමාන ප්‍රතිලාභ සැලසීමටය

18. සංඝට්ටන මුද්‍රණ යන්ත්‍රයකට උදාහරණයක් වන්නේ,
   1. ලකුණුකරණය (plotter)
   2. තිත් න්‍යාස මුද්‍රකය ( Dot Matri Printer)
   3. ලේසර් මුද්‍රකය ( Laser Printer)
   4. තීන්ත විදුම් මුද්‍රණ යන්ත්‍රය ( Ink Jet Printer)

19. APPLE සමාගමේ නිර්මාතෘ වන්නේ
   1. චාල්ස් බැබේජ්
   2. බිල් ගේට්ස්
   3. ස්ටීව් ජොබ්ස්
   4. හොවාර්ඩ් අයිකන්

20. නිවැරදි පිළිතුර තෝරන්න
   1. ලොව ප්‍රථම යාන්ත්‍රික ගණිත කර්ම කරන උපකරණය වූයේ Adding Machine නම් උපකරණයයි
   2. Bluetooth තාක්ෂණය යනු අන්තර්ජාල පහසුකම ලබා ගත හැකි ක්‍රමයකි
   3. Touch screen, ආදානය හා ප්‍රතිදානය එකවර සිදු කළ හැකි උපකරණයක් නොවේ
   4. MS Power point මෘදුකාංගය මගින් වීඩියෝ සංස්කරණය කළ හැක.

anned by janelaya.com

## II කොටස

- 1 වන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.

1.

I. මධ්‍ය සැකසුම් ඒකකයේ ප්‍රධාන කොටස් තුන මොනවාද?

II. PS/2 කෙවෙනිය හරහා පරිගණකයට සම්බන්ධ කළ හැකි උපාංග මොනවාද?

III. ඔබට පරිගණකය ආධාරයෙන් ලිපියක් නිර්මාණය කර ගැනීමට අවශ්‍ය වූ විට ඒ සඳහා යොදා ගන්නා මෘදුකාංගය කුමක්ද? එම ලිපිය එකවර බොහෝ දෙනෙකුට යැවීමට යොදා ගත හැකි ක්‍රමය කුමක්ද?

IV. පරිගණකයක් මිලදී ගැනීමේදී සැලකිල්ලට ගත යුතු කාරණා මොනවාද?

V. හදිසි විදුලි විසන්ධි වීමකදී පරිගණකය ආරක්ෂිතව වසා දැමීමට ( shut down) උපයෝගී කර ගන්නා උපකරණය කුමක්ද?

VI. දත්ත සම්ප්‍රේෂණ විධි ක්‍රම තුනක් දක්වන්න

VII. මධ්‍ය සැකසුම් ඒකකයේ ප්‍රධාන කොටස් තුන මොනවාද?

VIII. ප්‍රාථමික මතකය වර්ග තුනකි. ඒ මොනවාද?

IX. ද්විතියික ආයචනයට යොදා ගන්නා ඝන තත්වයේ උපක්‍රම දෙකක් දක්වන්න.

X. දෘඩ තැටියක් නිර්මාණය වී ඇති අංග කිහිපයක් දක්වන්න.

2.

I. ජාල ස්ථල විද්‍යාව යනු කුමක්ද?

II. පරිගණක ජාල ගත කළ හැකි ආකාර 3ක් ලියා ඒවා එකිනෙක ඇඳ දක්වන්න

III. පරිගණක ජාල භූමියේ පිහිටීම හා භාවිත කරන්නාගේ අවශ්‍යතාව අනුව වර්ග කළ හැකි ආකාර තුන මොනවාද?

IV. පරිගණක ජාලකරණයේ ඇති වාසි හා අවාසි 3 බැගින් ලියන්න

3. පහත සඳහන් ක්ෂේත්‍රවලට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගත හැකි ආකාරය පැහැදිලි කරන්න ( එක් ක්ෂේත්‍රයකට කරුණු 04 බැගින්)

I. කෘෂිකර්මාන්තය

II. සත්ව ගොවිපළ

III. කර්මාන්ත හා ව්‍යාපාර

anned by janelaya.com

4.

I. ප්‍රමාණය සැලකිල්ලට ගෙන පරිගණක වර්ග කල හැකි ආකාර ලියන්න

II. මිශ්‍ර පරිගණක යනු මොනවාද?

III. පරිගණකයේ ඇති සුවිශේෂී ලක්ෂණ 4ක් ලියන්න.

IV. පහත දැ ආදාන උපාංග හා ප්‍රතිදාන උපාංග ලෙස වර්ග කරන්න.

A. ස්පර්ශ සංවේදී තිරය ( Touch Screen)

B. වෙබ් කැමරාව ( web camera)

C. ස්පීකරය ( speaker)

D. පරිගණක තිරය( monitor)

E. තීරු කේත කියවනය ( barcode reader)

F. පියැවූ පරිපථ රූපවාහිනී කැමරාව (CCTV)

G. සංඝට්ටන මුද්‍රණ යන්ත්‍රය (Impact printer)

H. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය (ATM)

5.

I. ප්‍රධාන දත්ත සම්ප්‍රේෂණ මාධ්‍ය දෙක කුමක්ද? එම මාධ්‍ය දෙක සඳහා උදාහරණ වෙන වෙනම වෙන් වෙන්ව ලියා දක්වන්න

II. ස්විචයේ හා නාභියෙහි ඇති වෙනස්කම් තුනක් සන්සන්දනාත්මකව දක්වන්න

III. ගිනි පවුරක ඇති වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න

6.

I. දුරස්ථ අධ්‍යාපනය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

II. දුරස්ථ අධ්‍යාපනයේ ඇති ලක්ෂණ 3ක් දක්වන්න

III. ඉගෙනුම් කළමනාකරණ පද්ධතියකින් ශිෂ්‍යයාට ඇති පහසුකම් හා කළමනාකරණ අංශයට ඇති පහසුකම් 3 බැගින් දක්වන්න.

anned by janelaya.com